

# පුංචි සිතේ කවි

කතෘ
දුලංගයා තිසදි දිසානායක

# පුංචි සිතේ කවි

කතෘ
දුලංග්‍යා තිසදි දිසානායක

# පුංචි සිතේ කවි

දුලංගයා තිසදි දිසානායක

පළමු මුද්‍රණය

කතෘගේ වෙනත් කෘති
තිසදිගේ මල් පැළය

2025 පෙබරවාරි මස

# පිදුම

මාගේ පන්තිභාර ගුරු මෑණියන් වන
නිලූෂිකා ගුරුසිංහ
ගුරු මෑණියන්ටද,
1 හා 2 ශ්‍රේණි පන්තිභාර ගුරුතුමියව සිටි
ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ට ද,
මාගේ දයාබර දෙමව්පියන්ටද,
ගෞරවයෙන් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන .හෙරණගත්කරණීං ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| | |
|---|---|
| මගේ අප්පච්චි | 1 |
| මගේ අම්මා | 2 |
| මගේ වත්තේ මල් | 3 |
| මගේ ගුරුතුමිය | 4 |
| උදෑසන | 5 |
| හා පැටියා | 6 |
| ලේන් පැංචා | 7 |
| මගේ පලතුරු කඩේ | 8 |
| තෑග්ග | 9 |
| වෙසක් කූඩුව | 10 |

# මගේ අප්පච්චී

අපට හොඳින් උගන්වන්න
කෑම බීම ගෙනත් දෙන්න
ආදරයෙන් අප රැක දෙන
අප්පච්චී මගේ හරි හොඳ



# මගේ අම්මා

පුංචි කාලෙ ඉඳන් මාව
ලොකු කරන්න මහන්සි වුණ
කියලා දෙයි හොඳ ගති ගුණ
අම්මා මගේ ආදරෙ දෙන



# මගේ වත්තේ මල්

මගේ වත්තේ මල්
පාට පාට මල්
සුවඳ හමන මල්
හරි ලස්සන මල්



# මගේ ගුරුතුමිය

හොඳින් පාඩම් කියලා දෙන
හොඳ ගති ගුණ කියලා දෙන
කරුණාවයි ආදරෙ දෙන
ගුරුතුමියයි ඔබ මගේ හොඳ



# හා පැටියා

සුදුම සුදුයි හරි සිනිඳුයි
පුළුන් බෝලයක් වාගෙන්
කැරට් කන්න හරි ආසයි
හා පැටියා හරිම හොඳයි



# ලේන් පැංචා

ටිං ටිං ටිං ටිං ගාලා
අත්තෙන් අත්තට පැනලා
රස අඹ ගෙඩියක් කාලා
ලේන් පැංචා සතුටු වෙලා




# මගේ පලතුරු කඩේ

ලාබයි ලාබයි හරි ලාබයි
මගේ කඩේ පලතුරු ලාබයි
රස ගුණ පලතුරු දෙන්නෙ මමයි
ලාබයි ලාබයි හරි ලාබයි



# තෑග්ග

දිලිසෙන පටියෙන් ගැට ගසලා
මල් මල් කොළයෙන් අලවාලා
හම්බුණ තෑග්ග ලිහලා බැලුවා
මම ආසම පොත් ටික එහි තිබුණා



# වෙසක් කූඩුව

නිල් පාටින් කොළ කපලා
කහ පාටින් රැලි කපලා
වෙසක් කූඩුවේ අලවා
අක්ක නංගි හැඩ බැලුවා



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ISBN 978-624-208-281-3

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්